සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2025 ජූලි

## (204) ව්‍යාපාර කළමනාකරණය

(Business Management)

2025-07-27
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** සඵලදායීතාවය යනු:

(1) යෙදවුම් සහ නිමැවුම් අතර ඇති සම්බන්ධතාවයයි.
(2) නිවැරදි දේ කිරීම වේ.
(3) යමක් නිවැරදි අයුරින් කිරීම වේ.
(4) අන් අය හරහා යමක් කරවා ගැනීම වේ.

**1.2** පහත සඳහන් කාණ්ඩ අතුරෙන්, සම්ප්‍රදායික (බටහිර) කළමනාකරණ ශෛලියේ ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) මානව ප්‍රමුඛතාවය.
(2) පාරිභෝගික තෘප්තිය.
(3) ක්‍රියාවලි කෙරෙහි නැඹුරුතාවය.
(4) ප්‍රතිඵල මත නැඹුරුතාවය.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, අධිකාරීත්වය පැවරීමේ වාසියක් වන්නේ කුමක් ද?

(1) සඵලදායී කළමනාකරණය.
(2) වඩාත් හොඳ සම්බන්ධීකරණය.
(3) සේවක සංවර්ධනය.
(4) ඉහත සඳහන් සියල්ලම.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, සාර්ථක සන්නම් නාමයක් සඳහා අවශ්‍යතාවයක් **නොවන්නේ** කුමක් ද?

(1) අදාළ බව. (2) පැහැදිලි බව.

(3) සංකීර්ණ බව. (4) සුසංයෝගය (Coherence).

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, පෝටර්ගේ වටිනාකම් දාමයේ (Porter's Value Chain) උපකාරක / සහායක ක්‍රියාකාරකමක් **නොවන්නේ** කුමක් ද?

(1) තාක්ෂණික සංවර්ධනය. (2) අලෙවිකරණය සහ විකුණුම්.

(3) ප්‍රතිසම්පාදනය (Procurement). (4) මානව සම්පත් කළමනාකරණය.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

*අංක 1.6 සිට 1.10 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.6 ............ *(වගවීම / බලය)* යනු අන් අයට බලපෑම් කිරීමට පුද්ගලයෙකුට ඇති හැකියාව වේ.

1.7 ............ *(විශේෂිකරණය / නම්‍යශීලීත්වය)* යනු නිලතන්ත්‍රවාදයේ ලක්ෂණයකි.

1.8 ............ *[බඳවා ගැනීම (ආකර්ෂණය) / මානව සම්පත් සැලසුම්කරණය]* යනු සංවිධානයේ ඇබෑර්තුවලට සුදුසුකම් සහිත අයදුම්කරුවන් කණ්ඩායමක් යොමුකර ගැනීමේ ක්‍රියාවලියයි.

1.9 ............ *(විකුණුම් / අලෙවිකරණ)* සංකල්පයේදී, භාණ්ඩවල ගුණත්වය පිළිබඳව නොසලකා හරිමින්, ආක්‍රමණශීලිව භාණ්ඩ විකුණනු ලැබේ.

1.10 ............ *(නිෂ්පාදකයින් කෙරෙහි අවධානය යොමු කිරීම / ඒකාබද්ධ පද්ධතිය)* යනු සමස්ත තත්ත්ව කළමනාකරණයේ [Total Quality Management (TQM)] මූලධර්මයකි. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

*අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීමේ (Market Segmentation) වාසි දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.12 "වෙළෙඳපොළට කිඳා බැසීම (Market Penetration)" සහ "වෙළෙඳපොළ සංවර්ධනය (Market Development)" අතර ඇති වෙනස සඳහන් කරන්න.

1.13 වෙතසෙහි වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

1.14 පෝටර්ගේ පොදු උපායමාර්ගයන්හි (Porter's Generic Strategies) ඇතුලත් උපායමාර්ගයක් ලෙස පිරිවැය නායකත්වය (cost leadership) කෙටියෙන් පැහැදිලි කරන්න.

1.15 අභ්‍යන්තරයෙන් සේවකයින් බඳවා ගැනීමේ ප්‍රතිපත්තියේ ඇති වාසි දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

ඉතා සීග්‍රයෙන් වර්ධනය වන මෘදුකාංග ආයතනයක් වන **Zenith Tech Solutions** තම කටයුතු පුළුල් කිරීමේ උපායමාර්ග සම්බන්ධයෙන් ඉතා වැදගත් තීරණයකට එළඹීමට අවධානය යොමු කරමින් සිටියි. ආයතනික ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් කළමනාකරුවන්ගේ කුසලතා මත පදනම්ව සමාගමේ කළමනාකරණ කණ්ඩායම, විවිධ මට්ටම්වලට බෙදා වෙන් කිරීමට සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ධූරාවලිය මත පදනම්ව, කළමනාකරුවන් වර්ගීකරණය කිරීමේදී, **Zenith Tech Solutions** විසින් සළකා බැලිය යුතු කුසලතා වර්ග දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) හෙන්රි මින්ට්ස්බර්ග් (Henry Mintzberg) ට අනුව, කළමනාකරුවෙකු සඳහා අවශ්‍ය වන තීරණ කාර්යයන් (decisional roles) දෙකක්(02) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(c) තාර්කික තීරණ (rational decisions) ගැනීමේදී, **Zenith Tech Solutions** හට මුහුණදීමට සිදුවන බාධක හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

**සීමාසහිත Tech Innovators සමාගම** කෘත්‍රිම බුද්ධිය මඟින් බල ගන්වනු ලබන විසඳුම් (AI-powered solutions) සම්බන්ධ ව්‍යාපාරයක නියැලී සිටී. **එමා, සීමාසහිත Tech Innovators සමාගමේ** ප්‍රධාන විධායක නිලධාරියා වන අතර, ඇය විසින් තම සමාගමේ වෙළෙඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ශක්තිමත් සැලසුමක අවශ්‍යතාවය වටහාගෙන ඇත. ඇය විසින් අවදානම් වළක්වා ගැනීම සඳහා සැලසුම් ක්‍රියාවලිය අනුගමනය කරන අතර, ආයතනික ඉලක්ක සපුරා ගැනීම සඳහා අභිප්‍රේරණ ක්‍රියාවලියට කළමනාකරුවන්ගේ කාර්යභාරය ඉතා වැදගත් බව විශ්වාස කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවර **සඳහන් කරන්න.** (ලකුණු 04)

(b) ව්‍යාපාර සංවිධානයක ඇති සැලසුම් වර්ග දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(c) සංවිධානයක සේවකයින් අභිප්‍රේරණය කිරීමේදී, කළමනාකරුවෙකුගේ කාර්යභාරයන් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

**සීමාසහිත PQR Techno සමාගමේ** මානව සම්පත් අංශය විසින් සේවක සුභසාධන කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට සැලසුම් කරයි. තවද, මෙහෙයුම් කළමනාකරු විසින් කාර්යක්ෂම දෛනික ක්‍රියාවලියන් තහවුරු කරනු ලබන අතර, නිෂ්පාදන කාලසටහන් සහ නිෂ්පාදන ක්‍රියාවලියේ සම්පත් කළමනාකරණය අධීක්ෂණය කරනු ලබයි. ශ්‍රිතීය කළමනාකරුවන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ පිළිවෙල පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කරන අතර, සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා නවෝත්පාදන සහ දිගුකාලීන දැක්ම බලගන්වමින් නායකයෙකු ලෙස කළමනාකරණ සහ කළමනාකරණ නොවන සමස්ත සේවකයින් පෙළඹවීම සහ අභිප්‍රේරණය කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත PQR Techno සමාගම** තුළ හොඳ සේවක සුහසාධන කළමනාකරණ පද්ධතියක් තිබීමේ ප්‍රතිලාභ (වාසි) තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) **සීමාසහිත PQR Techno සමාගමට** ඉහළ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා පහත සඳහන් මෙහෙයුම් කළමනාකරණ කාර්යයන් ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේදැයි **පැහැදිලි කරන්න:**

  (i) සැපයුම්දාම කළමනාකරණය.

  (ii) තත්ත්ව කළමනාකරණය. (ලකුණු 05)

(c) "නායකයෙකු" සහ "කළමනාකරුවෙකු" අතර ඇති වෙනස්කම් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**Global Solutions** යනු කොළඹ සිට ක්‍රියාත්මක වන වෙළෙඳ දැන්වීම් ආයතනයකි. **Global Solutions** හි, පැවති කණ්ඩායම් රැස්වීමකදී ප්‍රධාන විධායක නිලධාරියා විසින් සේවකයින්ගේ අවශ්‍යතා අවධාරණය කරමින් සේවක අභිප්‍රේරණය සඳහා ඒබ්‍රහම් මැස්ලෝගේ (Abraham Maslow) අවශ්‍යතා ධූරාවලි න්‍යාය (Hierarchy of Needs Theory) භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරනු ලැබිය. තවද, **Global Solutions** හි සාර්ථකත්වය සඳහා සඵලදායී සන්නිවේදනයේ ඇති වැදගත්කම ඔහු විසින් ඉස්මතු කරනු ලැබිය. **Global Solutions** හි භාවිත වන සඵලදායී පාලනය, ව්‍යාපාරයේ වත්මන් ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රධාන සාධකයක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **Global Solutions** හි සේවකයින් අභිප්‍රේරණය කිරීමට භාවිත කළ හැකි අවශ්‍යතා ධූරාවලි න්‍යායේ ඇති අවශ්‍යතා වර්ග දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) **Global Solutions** සඳහා පාලනය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(c) සඵලදායී සන්නිවේදනයෙන් **Global Solutions** වෙත ලැබෙන ප්‍රතිලාභ දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත MMC සමාගම,** නිෂ්පාදන ක්‍රියාවලිය සහ එය සැලසුම්කරණය සඳහා කෘත්‍රිම බුද්ධිය මඟින් සිදුවන ස්වයංක්‍රියකරණය භාවිත කිරීමට සැලසුම් කරනු ලබයි. වෙනස්වීම් සඳහා සේවකයින්ව මඟ පෙන්වීමේදී පරිවර්තනීය නායකත්වය (transformation leadership) වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. සේවකයින් නව වැඩ පරිසරයට සංක්‍රමණය වීම පහසු කිරීම සඳහා කළමනාකරණය විසින් පැහැදිලි සන්නිවේදනය, අභිප්‍රේරණය සහ පුහුණු වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කරමින් පරිවර්තනීය නායකත්ව ප්‍රවේශයක් අනුගමනය කරනු ලබයි. කෙසේවුවද, සමහර සේවකයින් වෙනස්වීමට ප්‍රතිරෝධය දක්වා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත MMC සමාගමේ** මෙහෙයුම් කටයුතු කෙරෙහි නව තාක්ෂණයෙන් ඇති වන බලපෑම් දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) වෙනස පිළිගැනීමට සේවකයින් දිරිමත් කළ හැකි ක්‍රම හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(c) **සීමාසහිත MMC සමාගම** සඳහා පරිවර්තනීය නායකත්ව න්‍යායයේ අදාළත්වය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගම,** දශක දෙකකට වැඩි කාලයක් පුරා සීඝ්‍රයෙන් අලෙවි වන පාරිභෝගික භාණ්ඩ [Fast-Moving Consumer Goods (FMCG)] අංශයේ නියුතු ශ්‍රී ලාංකික සමාගමකි. ඇතැම් නිෂ්පාදිත භාණ්ඩවල වෙළෙඳපොළ ප්‍රමුඛයෙකු වුවද, ආර්ථික අස්ථාවරත්වය, වෙනස්වන පාරිභෝගික රුචිය සහ වේගවත් තාක්ෂණික දියුණුව හේතුකොටගෙන සමාගම දැනට විවිධ වූ අභියෝගයන්ට මුහුණදෙමින් සිටියි.

මෑතකාලීන ආර්ථික අර්බුධය පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ ශක්තියට සැලකිය යුතු ලෙස බලපා ඇත. උද්ධමනය සහ විනිමය අනුපාත උච්චාවචනය, අමුද්‍රව්‍ය පිරිවැය ඉහළ යාමට බලපා ඇති අතර, මෙමගින් **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමට** භාණ්ඩවල මිල ඉහළ දැමීමට හෝ ලාභ ආන්තිකය අඩුකිරීමට බලපෑම් කර ඇත. ශ්‍රී ලංකා රජය නව බදු ප්‍රතිපත්ති සහ ආනයන සීමාවන් ක්‍රියාත්මක කර ඇති අතර, ඒවා සමාගමේ සැපයුම්දාමයට බලපෑමක් ඇතිකර තිබේ.

මීට අමතරව, පාරිභෝගිකයන් ඩිජිටල් වේදිකාවන් (digital platforms) වෙත යොමු වී සිටී. විද්‍යුත් වාණිජ්‍යයේ සහ සමාජ මාධ්‍ය අලෙවිකරණයේ නැගීමත් සමඟ තරඟකාරීත්වය පවත්වා ගැනීම සඳහා **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගම** තම අලෙවිකරණ උපායමාර්ග අනුවර්තනය කළ යුතු වේ. කෙසේවුවද, තම මෙහෙයුම් කටයුතු සඳහා ඩිජිටල් පරිවර්තනය ඒකාබද්ධ කිරීමට මන්දගාමීත්වයක් සමාගම පෙන්නුම් කර ඇත.

මානව සම්පත් දෘෂ්ඨි කෝණයෙන් බලන කල, සමාගම, කුසලතා රඳවා තබා ගැනීම, සේවක අභිප්‍රේරණය සහ දුරස්ථව වැඩ කිරීමට අනුවර්තනය වීම යන අභියෝගයන්ට මුහුණ පාමින් සිටියි. කුසලතා සහිත බොහොමයක් සේවකයින් විදේශයන්හි වඩා හොඳ රැකියා අවස්ථා සොයන අතර, එමගින් කුසලතා ගලනයකට ලක්වී ඇත. වේතන වර්ධනය නොවීම සහ වෘත්තීමය ප්‍රගමනයක් නොමැති වීමෙන් සේවක අතෘප්තිය වැඩිවෙමින් පවතී.

මෙම අභියෝගවලට ප්‍රතිචාර වශයෙන් **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගම,** ඩිජිටල් අලෙවිකරණ ඒකාබද්ධ කිරීම, නිෂ්පාදන අංශ විවිධාංගීකරණය කිරීම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ශ්‍රම බලකාය ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළුව උපායමාර්ගික වෙනසක් සලකා බලමින් සිටී. වඩාත් අනුවර්තනය කළ හැකි සහ නව්‍ය ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් වෙනස කළමනාකරණ උපාය මාර්ග කෙරෙහි අවධානය යොමු කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමට** තම විකුණුම් වැඩිකර ගැනීම සඳහා භාවිත කළ හැකි ඩිජිටල් අලෙවිකරණ ක්‍රම තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමට** සදාචාර සම්පන්න අලෙවිකරණය (ethical marketing) වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(c) **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමට** සංවිධානයේ සේවකයින් රඳවා තබා ගැනීම සඳහා භාවිත කළ හැකි ක්‍රම හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(d) මානව සම්පත් කළමනාකරණයේ අරමුණු හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(e) **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමේ** උපායමාර්ගවලට බලපාන අභ්‍යන්තර සාධක තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |